සියලුම හිමිකම් ඇවිරිණි / All Right Received

ආනන්ද විද්‍යාලය - කොළඹ 10
Ananda College – Colombo 10

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2016
දෙවන වාර පරීක්ෂණය - 2016 අප්‍රේල්

ගිණුම්කරණය II 13 ශ්‍රේණිය | කාලය : පැය තුනයි

- පළමු හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

(1) සීමිත 'CAS' පොදු සමාගමේ 2015/3/31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

alsciencepapers .blogspot.com

රු. 000 වලින්.

	හර	බැර
එකක් රු.10 ක් වූ සා. කොටස් ප්‍රාග්ධනය		2000
රු. 10 නිදහස් කළ නොහැකි වරණීය කොටස් ප්‍රාග්ධනය (වසරකට රු. 1 ක ලාභාංශයක් සහිත)		500
පොදු සංචිතය		800
ප්‍රත්‍යාගණන සංචිතය		350
රඳවාගත් ඉපැයුම්		700
විකුණුම්		8000
2014/4/01 දිනට තොගය	800	
ගැනුම්	3000	
ඉඩම් - පිරිවැය	3000	
ගොඩනැගිලි - පිරිවැය	2000	
මෝටර් රථ - පිරිවැය	1500	
ක්ෂය වෙන් කිරීම. 2014/04/01		
මෝටර් රථ		150
ගොඩනැගිලි		300
ගෙවූ ලාභාංශය - සාමාන්‍ය කොටස්	50	
වරණීය කොටස්	30	
කල්බදු ණය හිමියෝ		894
ලද වට්ටම්		50
ප්‍රවර්තන වර්ෂයේ පළමු කාර්තු තුන සඳහා ගෙවූ ආදායම් බදු	400	
සේවක අර්ථසාධක අරමුදල් වියදම	150	

Scanned by CamScanner

සේවක භාරකාර අරමුදල් වියදම	30	
අධ්‍යක්ෂ ගාස්තු	80	
විගණන ගාස්තු	80	
වැටුප්	1000 + 200	
විකුණුම් අධ්‍යක්ෂකගේ වේතන	380	
දුරකතන ගාස්තු	183	
15% ණයකර		500
කල්බදු පොලී	360	
ආයෝජන ආදායම		100
අඩමාණ ණය වෙන්කිරීම, 2014/4/1		60
වෙළඳ ලැබිය යුතු දෑ	800	
වෙළඳ ගෙවිය යුතු දෑ		480
මුදල් හා බැංකු	1041	
	14884	14884

අමතර තොරතුරු.

alsciencepapers .blogspot.com

(1) 2015/3/31 දිනට තොගයේ පිරිවැය රු. 50 000 ක් වන අතර මෙහි අපේක්ෂිත විකුණුම් වටිනාකම රු. 52000 කි. එසේ රු. 52 000 කට විකිණීම සඳහා රු. 8000 ක අනිවාර්ය විකුණුම් වියදමක් දැරීමට සිදුවේ.

(2) 2015 මාර්තු මාසය සඳහා සේවකයින්ගේ දළ වැටුප 200 000 ක් වූ අතර එය වාර්තා කර නොමැත. EPF සඳහා සේවා හා සේවක දායකයන් පිළිවෙලින් 15% ක් හා 10% ක් වන අතර ETF දායකය 3% ක් වේ. EPF හා ETF දායකයන් සේවකයින්ගේ දළ වැටුප මත ගණනය කරනු ලැබේ. සේවක වැටුප්, EPF දායකයන් හා ETF දායකයන් ඊළඟ මාසයේදී ගෙවීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

(3) වසර අග වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය මත 10% ක් අඩමාණ ණය සඳහා වෙන් කරනු ලැබේ.

(4) සමාගම විසින් මාස හයක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. මෙම වගකීම් සහතිකය සඳහා විකුණුම් වටිනාකම මත 2% ක ප්‍රතිපාදනයක් කළ යුතු යැයි විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කර ඇත.

(5) 2014/2015 වර්ෂය සඳහා ආදායම් බද්ද, බදු පෙර ලාභයෙන් 20% ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(6) 2015/3/31 දින සමාගම සතු ගොඩනැගිලි රු. 100[illegible] කට ප්‍රත්‍යාගණනය කළ අතර එම ගොඩනැගිල්ලෙ මීට පෙර ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලැබූ ප්‍රත්‍යාගණන ලාභය වූ රු.350 000 ප්‍රත්‍යාගණන සංචිතයෙන් නිරූපණය කෙරේ.

Scanned by CamScanner

(7) සියලුම ක්ෂය කළ හැකි දේපළ පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලැබේ.

(8) මෝටර්රථය 2013/4/1 දින මූල්‍ය කල්බද්දක් යටතේ වසර 4ක කාලයකට අත්පත් කරගෙන ඇත. ගෙවිය යුතු වාර්ෂික කල්බදු වාරිකය රු. 360 000 කි. ප්‍රවර්තන වර්ෂයේ කල්බදු වාරිකය ගෙවා ඇති අතර එය කල්බදු පොලී ගිණුමට හර කර ඇත. ප්‍රවර්තන වර්ෂය සඳහා හා ඊළඟ වර්ෂ 2ක සඳහා අදාළ කල්බදු පොලී පහත පරිදි වේ.

වසර	පොලිය (000')
2014/2015	90
2015/2016	65
2016/2017	34

(9) රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනික කරමින් කොටසක් රු.10 බැගින් සාමාන්‍ය කොටස් 40000ක් දැනට සිටින කොටස්කරුවන්ට නිකුත් කර ඇත.

(10) 2015/3/31 දින සමාගම රඳවාගත් ඉපැයුම් වලින් රු. 100 000 ක් පොදු සංචිතයට මාරු කිරීමට තීරණය කර ඇති අතර සාමාන්‍ය කොටස්කරුවන් සඳහා රු. 200 000 ක ලාභාංශයක් ගෙවීමට යෝජනා කර ඇත.

alsciencepapers .blogspot.com

අවශ්‍ය වන්නේ,

ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත 'CAS' පොදු සමාගමේ

1) 2015/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2) 2015/3/31 දිනෙන් අවසන් වසර සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

3) 2015/3/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය (ලකුණු. 20)

(2) (අ) අමිල හා නිමිල 2 : 1 ලෙස ලාභ හා අලාභ බෙදා ගනිමින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ 2014/03/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය පහත දැක්වේ.

	රු. 000'
<u>ජංගම නොවන වත්කම්</u>	
දේපළ පිරියත උපකරණ - ධාරන අගය	1500
<u>ජංගම වත්කම්</u>	600
	2100
මුළු හිමිකම්	1070
ජංගම නොවන වගකීම් - ණය නිමිල	800
ජංගම වගකීම්	230
	2100

Scanned by CamScanner

- දේපළ පිරියත උපකරණ අගය තුළ රු. 300 000 ක සමුච්චිත ක්ෂය ඇතුලත්ය.
- ජංගම වත්කම් තුළ පහත ද ඇතුලත්ය.

තොගය	රු. 120 000
ණයගැතියෝ	රු. 150 000
කෙටි කාලීන ණය	රු. 230 000
මුදල්	රු. 100 000

- 2014/3/31 දිනට මුළ හිමිකම් හා ප්‍රාග්ධන ශේෂ පහත පරිදි වේ.

	අමිල	නිමිල
මුළ හිමිකම	600 000	470 000
ප්‍රාග්ධන ගිණුම	500 000	490000

- ජංගම වගකීම් තුළ ණයහිමියෝ රු. 130000ක් ද ඉතිරිය උපචිත මෙහෙයුම් වියදම් ද විය.

alsciencepapers .blogspot.com

අතිරේක තොරතුරු

(1) අමිල හා නිමිල අතර පැවති හවුල් ගිවිසුමේ අනෙකුත් කොන්දේසි මෙසේය.

i) අමිලගේ වාර්ෂික වේතනය රු. 80 000 ක් වන අතර නිමිලගේ මාසික වේතනය රු. 5 000 කි.

ii) ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත පොලිය වාර්ෂිකව 10%කි.

(2) 2015/3/31 න් අවසන් වර්ෂය තුළ පහත ගණුදෙනු ද සිදු වී ඇත.

i) මුළ විකුණුම් 26 00 000 ක් වන අතර 800 000 ක් අත්පිට විකුණුම් වේ.

ii) ව්‍යාපාරයේ සියළු ගැණුම් ණය පදනම මත සිදු කරන අතර වර්ෂය තුළ ණයහිමියන්ට ගෙවූ මුදල රු. 1260000 කි.

iii) මුදලින් ගෙවූ මෙහෙයුම් වියදම රු. 300 000 කි.

iv) මුදල් ගැනිලි - අමිල රු. 80 000
නිමිල රු. 60 000

v) නිමිලගේ ණය මත ගෙවා ඇති පොලිය රු. 20 000 කි. ණය පොලී සම්බන්ධව ප්‍රතිපාදනයක් හවුල් ගිවිසුම තුළ අන්තර්ගත නැත.

vi) 2014/10/01 දින මිලට ගත් ලී බඩු වල වටිනාකම රු. 160000 කි.

(3) දේපළ පිරියත උපකරණ පිරිවැය මත 10% මැයින් ක්ෂය කළ යුතුය.

Scanned by CamScanner

(4) 2015/3/31 දිනට ජංගම වත්කම් (මුදල් හැර) හා ජංගම වගකීම් පහත දැක්වේ.

	රු. 000'
තොගය	100
ණයගැතියෝ (ශුද්ධ)	160
ණයහිමියෝ	150
උපචිත වියදම්	30
කෙටි කාලීන ණය - අමිල	100

(5) 2015/3/31 දින නිමල හවුල් ව්‍යාපාරයේ විශ්‍රාම ගත් අතර ඔහුගේ හිමිකම ණය ගිණුමකට මාරු කර රු. 500000 ක් මුදලින් ගෙවීමටත් ඉතිරිය පසුව ගෙවීමටත් එකඟ විය. එදිනම නව හවුල්කරුවකු ලෙස සුනිල ව්‍යාපාරයට බඳවා ගත් අතර ඔහු මුදලින් රු. 300000 ක් ද, රු. 200000 ක් වටිනා යන්ත්‍රයක් ද ව්‍යාපාරයට රැගෙන ආවේය. මෙහිදී කීර්තිනාමය රු. 600000 ක් ලෙස තක්සේරු කළ අතර අවශ්‍ය ගැලපීම් ප්‍රාග්ධන ගිණුම් තුළින් සිදු කළ යුතුය.
අමිල හා සුනිල ලාභ ලාභ 3 : 2 අනුපාතයට බෙදා ගැනීමට එකඟ විය.

අවශ්‍ය වන්නේ,

alsciencepapers .blogspot.com

1) 2015/3/31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය (විසර්ජනද ඇතුළුව)
2) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම්
3) 2015/3/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශණය

(ආ) නිමාලිගේ ව්‍යාපාරය ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයට අනුව ලී බඩු නිෂ්පාදනය කරන ආයතනයකි. මෙම ආයතනය නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් හා සේවා දෙපාර්තමේන්තුවකින් සමන්විත වේ.

ඉදිරි කාලච්ඡේදයක් සඳහා පිරිවැය ඇස්තමේන්තු පහත දැක්වේ.

පොදු කාර්ය පිරිවැය	නිෂ්පාදන දෙපාර්තමේන්තු		සේවා දෙපාර්තමේන්තු
	A	B	C
	රු. 000'	රු. 000'	රු. 000'
වක්‍ර ද්‍රව්‍ය	480	180	30
වක්‍ර වේතන	360	120	20
වක්‍ර වියදම්	30	20	10

Scanned by CamScanner

අනෙකුත් පොදු කාර්ය පිරිවැය	රු. 000'
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	400
කුලී වරිපනම් හා විදුලිය	300
සේවක සුභසාධන වියදම්	200

වෙනත් අදාළ තොරතුරු

	දෙපාර්තමේන්තු		
	A	B	C
යන්ත්‍ර සූත්‍ර (පිරිවැය)	2500	1400	100
බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	60 000	30 000	10 000
සේවක සංඛ්‍යාව	60	30	10
සෘජු ශ්‍රම පැය	74000	67000	

සේවා දෙපාර්තමේන්තුව නිෂ්පාදන දෙපාර්තමේන්තුවලට සමනව සේවා සපයයි.

alsciencepapers .blogspot.com

අවශ්‍ය වන්නේ විභජන පදනම් දක්වමින්

1) පොදු කාර්ය පිරිවැය විභජන පත්‍රිකාව
2) සේවා දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය A හා B දෙපාර්තමේන්තු අතර යළි විභජනය කරන්න.
3) සෘජු ශ්‍රම පැය පදනම් මත A හා B දෙපාර්තමේන්තු සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය අනුපාත ගණනය කරන්න.

(ල. 20)

(3) අනුරංගි ව්‍යාපාරයේ 2015/4/01 දිනට උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	රු. 000' හර	රු. 000' බැර
දේපල පිරියත උපකරණ	2000	
තොගය	500	
ණයගැතියෝ (ශුද්ධ)	360	
බැංකුව	2800	
ණයහිමියෝ		660
හිමිකම		5000
	5660	5660

Scanned by CamScanner

2015 අප්‍රේල් මාසයේදී ව්‍යාපාරයේ සිදු වූ ඇතැම් ගනුදෙනු සමීකරණය භාවිතා කරමින් පහත දක්වා ඇත.

ගනුදෙනු අංකය	වත්කම්				ණයහිමියෝ	හිමිකම
	දේපල පිරියත උපකරණ	තොගය	ණයගැතියෝ	බැංකුව		
1	+1000			-1000		
2		+500		-200	+300	
3		- 400	+250	+250		+100
4		+40	-50			-10
5			+20	-20		
6				+300		+300
7			-180	+160		-20
8				-70	-80	+10
9					-250	+250
10		-30				-30

alsciencepapers .blogspot.com

අතිරේක තොරතුරු

(1) ඉහත අංක 06 ගනුදෙනුව ශුද්ධ ලාභයට බලපෑමක් ඇති නොකරයි.

(2) දේපල පිරියත උපකරණ වාර්ෂිකව පිරිවැය මත 10% ක්ෂය කළ යුතුය.

(3) රු. 200 000 ක ගැණුම් ඉන්වොයිසියක් පොත් වලින් මග හැරී ඇත.

(4) රු. 240 000 ක ණයට විකුණුම් සටහන් කර නැත. එම තොගයේ පිරිවැය රු. 120 000කි.

(5) රු. 80 000 ක ණයගැතියෙකු සෘජුවම මුදල්. බැංකු ගිණුමේ තැන්පත් කර ඇතත් පොත් වල සටහන් වී නැත.

(6) ව්‍යාපාරය තම ණයගැතියන් මත 10% ක අඩමාණ ණය වෙන් කිරීමක් පවත්වාගෙන යාම ප්‍රතිපත්තියකි.

අවශ්‍ය වන්නේ,

1) ගනුදෙනු අංක 1 සිට 10 දක්වා විස්තර කිරීම.

2) ගනුදෙනු හා අතිරේක තොරතුරු භාවිතා කරමින් 2015/04/30 න් අවසන් මාසයේ ආදායම් ප්‍රකාශනය

3) 2015/04/30 දිනට ව්‍යාපාරයේ හිමිකම් ගණනය කරන්න. (ලකුණු 15)

Scanned by CamScanner

(4) 2016/01/01 වන දින ව්‍යාපාරික කටයුතු ආරම්භ කළ සමන්තගේ ව්‍යාපාරයේ 2016 ජනවාරි මාසයට අදාළව පහත තොරතුරු සපයා ඇත.

ණයගැති පාලන ගිණුම (රු. 000')

විකුණුම්	4000	ආපසු එවුම්	380
දුන් වට්ටම්	200	මුදල්	1300
		බොල්ණය	80
		ශේෂය ප/ගෙ	2440
	4200		4200
ශේෂය ඉ/ගෙ	2440		

ණයහිමි පාලන ගිණුම (රු. 000')

ණය යැවුම්	150	ගැණුම්	3200
මුදල්	1350		
ලද වට්ටම්	100		
ශේෂය ප/ගෙ	1600		
	3200		3200
		ශේෂය ඉ/ගෙ	1600

alsciencepapers .blogspot.com

ණයගැති ලේජරයේ සාරාංශය (සියළු වටිනාකම් රු. 000' වලිනි)

ණයගැතියා	ණයට විකුණුම්	ආපසු එවුම්	මුදල් ලැබීම්	දුන් වට්ටම්	2016/01/31 දිනට ශේෂය
ජයනි	2200	-	600	100	1500
රනුකි	800	220	500	-	80
අමල්	1200	-	200	100	900
	4200	220	1300	200	2480

ණයහිමි ලේජරයේ සාරාංශය (සියළු වටිනාකමේ රු. 000' වලිනි)

ණය හිමියා	ණයට ගැණුම්	ආපසු යැවුම්	මුදල් ගෙවීම්	ලද වට්ටම්	2016/01/31 දිනට ශේෂය
කමල්	2100	100	700	50	1250
තිසර	1000	50	650	-	300
	3100	150	1350	50	1550

Scanned by CamScanner

අතිරේක තොරතුරු

2016/1/31 දිනට ණයගැති ලෙජරයේ සහ ණයහිමි ලෙජරයේ ශේෂ වල එකතුව, පාලන ගිණුම් වල ශේෂ සමග අසමාන වීමට හේතුන් පහත පරිදිවේ.

(1) විකුණුම් ජ'නලය අඩුවෙන් එකතු කර ඇති අතර එම වටිනාකම ණයගැති පාලන ගිණුමේ හා විකුණුම් ගිණුමේ සටහන් කර ඇත.

(2) අමල්ගේ රු. 160 000 ක ආපසු එවුම් ණයගැති ලෙජරයේ ඔහුගේ පෞද්ගලික ගිණුමේ සටහන් කර නොමැත.

(3) දුන් වට්ටම් ණයගැති පාලන ගිණුම හර කර විකුණුම් ගිණුමට බැර කර ඇත.

(4) 2016/01/31 දිනට රනුකිගෙන් අය විය යුතු ශේෂය බොල්ණය ලෙස කපා හල නමුත් ණයගැති ලෙජරයේ ඔහුගේ පෞද්ගලික ගිණුමේ එය සටහන් කර නොමැත. alsciencepapers .blogspot.com

(5) ගැනුම් ජ'නලය එකතු කිරීමේදී වැඩියෙන් එකතු කර ඇති අතර එය ගැනුම් ගිණුමේ හා ණයහිමි පාලන සටහන් කර ඇත.

(6) නිසරිගෙන් ලද වට්ටම ණයහිමි ලෙජරයේ ඇයගේ පෞද්ගලික ගිණුමේ සටහන් කර නොමැත.

(7) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර 2016/1/31 න් අවසන් මාසය සඳහා ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 300 000 ක් ලෙස කෙටුම්පත් කර ඇත.

අවශ්‍ය වන්නේ.

1) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර 2016/1/31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය හා ණයගැති ලෙජර් ශේෂවල එකතුව සැසඳීමේ ප්‍රකාශනයක්

2) පොදු ලෙජරයේ සිදුව ඇති වැරදි නිවැරදි කිරීමේ ජනල් සටහන (සංලේඛනය අවශ්‍ය වේ.)

3) ණයගැති පාලන ගිණුමේ හා ණයහිමි පාලන ගිණුමේ ශේෂ නිවැරදි කිරීම.

4) 2016/1/31 න් අවසන් මාසය සඳහා සංශෝධිත ලාභය / අලාභය

(ලකුණු. 15)

Scanned by CamScanner

(5) (අ) රංග, සුරංග හා අසංක, සමාගමක සේවකයන් වන අතර 2015 මාර්තු මාසය සඳහා ඔවුන්ගේ වැටුප් සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

සේවකයාගේ නම	සාමාන්‍ය පැය	අතිකාල පැය
රංග	160	20
සුරංග	150	-
අසංක	160	10

- සාමාන්‍ය පැයකට රු. 100 බැගින් හා අතිකාල පැයකට පැයක රේටය මෙන් එක හමාරක් ගෙවනු ලබයි.
- 2015/03/01 දිනට පහත ශේෂ දක්නට ලැබුණි.

	රු.
ගෙවිය යුතු වැටුප් ගිණුම	43000
ගෙවිය යුතු EPF ගිණුම	9600
ගෙවිය යුතු ETF ගිණුම	1440

alsciencepapers .blogspot.com

- සේව්‍යා සහ සේවකයා විසින් සේවක අර්ථ සාධක අරමුදලට කරන දායකත්වය පිළිවෙලින් 15% ක් හා 10% ක් වන අතර සේවක භාරකාර අරමුදලට සේව්‍යාගේ දායකය 3% කි. මූලික වැටුප මත EPF සහ ETF ගණනය කරනු ලබයි.
- රංග හට මාසිකව රු. 3000 ක දිරි දීමනාවක් හිමි වේ.
- පහත අඩු කිරීම් සිදු කළ යුතු වේ.

වැටුප් අත්තිකාරම් (සුරංග) රු. 1000

ණය වාරිකය (අසංක) රු. 2000

- සෑම මසකම වැටුප ඊළඟ මාසයේ 10 වන දින ගෙවන අතර සෑම මසකම අර්ථ සාධක සහ සේවක භාරකාර අරමුදල් දායකයන් ඊළඟ මාසයේ 15 වන දින ගෙවනු ලබයි.

අවශ්‍ය වන්නේ,

1) 2015 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය

2) 2015 මාර්තු මාසය සඳහා පහත ගිණුම්

   i) වැටුප් පාලන ගිණුම

   ii) ගෙවිය යුතු වැටුප් ගිණුම

   iii) ගෙවිය යුතු EPF ගිණුම

   iv) ගෙවිය යුතු EPF ගිණුම

3) 2015 මාර්තු මාසය සඳහා සේවකයන්ට අදාළ මුළු වියදම

Scanned by CamScanner

(ආ) 2015/3/31 න් අවසන් වසර සඳහා පහත සඳහන් තොරතුරු N නැමැති ආයතනයකට අදාල වේ.

- වාර්ෂික ඉල්ලුම ඒකක 36 000
- තොග තබා ගැනීමේ පිරිවැය ඒකකයකට රු. 8
- එක් ඇණවුමක් සඳහා පිරිවැය රු. 10
- පාරිභෝජනය ඒකක-අවම 50 උපරිම 100
- පොරොත්තු කාලය සති අවම 2 , උපරිම 4

අවශ්‍ය වන්නේ,

1) ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ)
2) වර්ෂයකට කළයුතු ඇණවුම් ගණන
3) අවම තොග මට්ටම (ලකුණු. 15)

alsciencepapers .blogspot.com

(6) (අ) සුමිදු ව්‍යාපාරයේ 2015/3/31 දින සකසන ලද ශේෂ පිරික්සුම සම නොවූ බැවින් එකතුව අවිනිශ්චිත ගිණුමක සටහන් කරන ලදී. අවිනිශ්චිත ගිණුම මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දක්වා මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඇත.

(1) රු.120000 ක අත්පිට විකුණුම් වාර්තා කර ඇත්තේ මුදල් පොතෙන් ණය ගැති පාලන ගිණුමට වේ.

(2) ගෙවූ ලිපි ද්‍රව්‍ය රු. 20000 මුදල් පොතේ නිවැරදිව සටහන් කර දුරකථන ගාස්තු ගිණුමට රු. 200000 ක් ලෙස සටහන් වී ඇත.

(3) ණය හිමි සිල්වාට ගෙවූ මුදල රු. 12000 .. හර කර ඇත්තේ ණයගැති අල්විස්ගේ ගිණුමට වේ.

(4) රු. 150000 කට මිලදී ගත් භාණ්ඩ රු. 1500000 ක් ලෙස ගැණුම් ගිණුමට සටහන් වී තිබුණි.

(5) ලද වට්ටම් ගිණුමේ ශේෂය රු. 15000 ශේෂ පිරික්සුමෙන් මග හැරී ඇති අතර දුන් වට්ටම් ගිණුමේ ශේෂය ද රු. 45000 මග හැරී තිබුණි.

(6) වර්ෂයට අදාල කඩකුලී ගෙවීම රු. 55000 මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇති අතර අදාළ කඩකුලී ගිණුමට හර කර ඇත්තේ රු.5500 ක් ලෙසයි.

අවශ්‍ය වේ

1) අවිනිශ්චිත ගිණුම
2) වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන්

Scanned by CamScanner

(ආ) "සියරා ෆෝන්" නිෂ්පාදකයකු වන සීමාසහිත සේරා සමාගමේ 2015 වර්ෂයේ ගිණුම් පොත් වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

	ආරම්භක 2015/1/1	අවසන් 2015/12/31
අමුද්‍රව්‍ය	2,500	4,500
කෙරීගෙන යන වැඩ	10,500	10,000
නිමි තොගය	7,000	?
කර්මාන්ත ශාලා උපකරණ (ශුද්ධ)	4750	4150

alsciencepapers .blogspot.com

2015/12/31 න් අවසන් වර්ෂයට අදාළ අනෙක් ශේෂයන්

අමුද්‍රව්‍ය ගැණුම්	රු. 80,000
විකුණුම්	රු. 159,000
නිෂ්පාදන වේතන	රු. 30,000
නිෂ්පාදන පොදු කාර්ය (ක්ෂය හැර)	රු. 25,000
කර්මාන්ත ශාලා උපකරණ මිලට ගැනීම	රු. 900

2015 ජනවාරි 1 දිනට තොගයේ තිබූ සියරා ෆෝන් ප්‍රමාණය 2500 කි. 2015 වර්ෂය තුළ දී නිෂ්පාදනය කළ සියරා ෆෝන් ප්‍රමාණය ඒකක 45000 ක් වූ අතර, ඒකක 46000 ක් විකුණා ඇත.

ඔබ විසින්

1) 2015 වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම පිළියෙල කරන්න.
2) මූල නිෂ්පාදන පිරිවැය මත පදනම්ව 2015 වර්ෂයේ අවසාන නිමි තොගයේ වටිනාකම අගය කරන්න.
3) 2015 වර්ෂය සඳහා වෙළඳ ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු. 15)

Scanned by CamScanner

(7) පහත සඳහන් තොරතුරු සීමිත දෙව්සිත් සමාගමේ 2014 හා 2015 වසර වලට අදාළ වේ.

(අ) මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශණය මෙසේය.

රු. 000'

ජ/ නිවන වත්කම්	2014	2015
මෝටර් රථ (ශුද්ධ අගය)	500	430
ලී බඩු (ශුද්ධ අගය)	400	590
ජංගම වත්කම්		
තොගය	20	87
ණය ගැතියෝ	80	114
මුදල් හා බැංකු	80	11
	1080	1232
හිමිකම හා සංචිත		
රු.10 සා. කොටස් ප්‍රාග්ධනය	200	300
පොදු සංචිතය	60	40
රඳවාගත් ලාභ	250	300
ජංගම නොවන වගකීම්		
බැංකු ණය	360	300
ජංගම වගකීම්		
ණය හිමියෝ	150	280
උපචිත පොලී	44	-
ගෙවිය යුතු ආදායම් බදු	6	4
යෝජිත ලාභාංශ	10	8
	1080	1232

(ii) වසර 2015 මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් සාරාංශය මෙසේය.

මුදල් ලැබීම්	රු. 000'
වෙළඳ ණයගැතියෝ	810
කොටස් නිකුතුවෙන්	100
මෝටර් රථ විකුණුමෙන්	100

Scanned by CamScanner

<u>මුදල් ගෙවීම්</u>

වෙළඳ ණය හිමියන්ට	600
මෙහෙයුම් වියදම්	80
පොලී ගෙවීම්	54
බැංකු ණය ගෙවීම්	60
බදු ගෙවීම්	30
ලාභාංශ ගෙවීම්	55
ලී බඩු මිලට ගැනීම	200

(iii) වසර 2016 ට අදාලව ස්ථාවර වත්කම් ක්ෂය වීම් මෙසේය.

- මෝටර් රථ රු. 20,000
- ලී බඩු රු. 10,000

අවශ්‍ය වන්නේ. alsciencepapers .blogspot.com

1) LKAS 7 ප්‍රමිතියට අනුව 2015/3/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත දෙව්සිත් සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ආකාරයට)

2) වසර 2015 ට අදාළව පහත සඳහන් අනුපාත
   - i) දළ ලාභ අනුපාතය
   - ii) ජංගම අනුපාතය
   - iii) තොග පිරිවැටුම් අනුපාතය
   - iv) පොලී ආවරණ අනුපාතය

(ලකුණු. 15)

Scanned by CamScanner

WWW.LOL.LK

BUY

PAST PAPERS

071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES

Protect Yourself From Coronavirus

YOU STAY AT HOME

WE DELIVER!

ORDER NOW

075 699 9990

WWW.LOL.LK

LOL.lk
Learn Ordinary Level

0

TOP CATEGORIES

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

HUGE SALE – SHOP NOW

ISLANDWIDE DELIVERY
Free delivery on all orders over Rs. 3500

More than 1000+ Papers
For all major Subjects and mediums

ONLINE SUPPORT 24/7
Shopping Hotline 071 777 4440

FEATURED PRODUCTS

SORT BY

- GCE O/L Exam

GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART

GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART

GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART

GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00



GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00

GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00